ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2002 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2002 ජූනි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2002 ජූනි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 24.50 යි. තැපැල් ගාස්තුව : රු. 9.00 යි.

2002 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2002 ජූනි මස 21 වන දින.]

එල්. ඩී.—ඕ. 18/2002.

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත, 2002 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය, ඒ වගන්තියේ (ඌ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

2000 අංක 38 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඌ) 2002 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර උද්ගත වන ප්‍රාග්ධන ලාභ,".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඇතිවන ලාභ හෝ ආදායම අදහස් වේ." යන වචන වෙනුවට "2002 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙරාතුව ඇතිවන ලාභ හෝ ආදායම අදහස් වේ." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 2001 අංක 8 දරන පනතින් තව දුරටත් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, ඒ වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ ඡේදයේ (lxxiv) අනුඡේදයේ "ආයෝජන බැංකුව" යන වචන වෙනුවට "ආයෝජන බැංකුව :" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදය අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්—

"එසේ වුවද (ix), (xi), (xv), (xvii), (xx). (xxi), (xxxix), (li), (liv), (lxiv), (lxv) (lxvi),

(lxxii), (lxxiii) සහ (lxxiv) යන අනුඡේදවල සඳහන් පුද්ගල මණ්ඩල සම්බන්ධයෙන් වන විට හැර, මේ ඡේදයේ සඳහන් වෙනත් යම් පුද්ගල මණ්ඩලයක ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස් කිරීම, ඒ පුද්ගල මණ්ඩලයේ පිළිවෙලින් 61 වන වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ හෝ 122අ වගන්තිය යටතේ ආදායම් බදු අඩුකර ගනු ලැබූ යම් ලාභාංශවලින් හෝ පොලීවලින් සමන්විත වන ලාභ හෝ ආදායම්වලට ව්‍යාප්ත නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "ඒ පුද්ගලයාට ගෙවිය හැකි සමුච්චිත පොලිය" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඒ පුද්ගලයාට ගෙවිය හැකි සමුච්චිත පොලිය" යන වචන ආදේශ කිරීමෙන්, ;

(2) ඒ වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :–

"(ඉඉ) ඇමරිකන් ඩොලර් වලින් වටිනාකම නියම කෙරෙන ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන යලි ගොඩනැංවීමේ බැඳුම්කරවල ආයෝජනය කරන මුදල් මත යම් තැනැත්තකුට උපචිත වන පොලිය ;

(ඉඉඉ) ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ඇමෙරිකන් ඩොලර්වලින් වටිනාකම නියම කෙරෙන 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කරන මුදල් මත යම් තැනැත්තකුට උපචිත වන පොලිය," ;

(3) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ "බදු සංචිත සහතිකයක" යන වචන වෙනුවට, "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව පවාරණය කරන ලද බදු-සංචිත සහතිකයක" යන වචන ආදේශ කිරීමෙන්, ;

(4) ඒ වගන්තියේ (ඌ) ඡේදයෙහි "ඊට උපචිත වන පොලිය," යන වචන වෙනුවට, "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඊට උපචිත වන පොලිය," යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ඊ) ඡේදයේ "18 වන, 19 වන, 20 වන හෝ 21 වන වගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "18 වන, 18අ වන, 19 වන, 20 වන, 20අ වන, 21 වන, 21අ වන හෝ 21ආ වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "පළමුවන රුපියල් පන්දහස" යන වචන වෙනුවට "පළමුවන රුපියල් පන්දහස,", යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඈ) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 7 වන වගන්තියේ සඳහන් කවර හෝ ගනුදෙනුවකින් යම් තැනැත්තකුට ඇතිවන ප්‍රාග්ධන ලාභවල එකතුව".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, ඒ වගන්තියේ (2) උපවගන්තියේ "ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින්" යන වචන වෙනුවට, "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, ඒ වගන්තියේ "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන වෙනුවට "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන හා ඉලක්කම් වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2003 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන හා ඉලක්කම් වෙනුවට "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ව්‍යාපාරය ආරම්භ කරන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ සහ 21ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ සහ 21ආ වගන්ති ලෙස බල පැවැත්විය යුතු ය :–

"ඇතැම් කෘෂිකාර්මික හා කාර්මික ව්‍යාපෘති ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21අ (1) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, යම් සමාගමක් විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඒ සමාගම විසින් කරගෙන යන්නා වූ යම් නිශ්චිත ව්‍යවසායකින් 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම හැර) ලාභ සහ ආදායම, ඒ ව්‍යවසාය විසින් වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කරන ලද්දේ යම් තක්සේරු වර්ෂයක් තුළ දී ද, ඒ තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ගණන් බලන අවුරුදු තුනක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "නිශ්චිත ව්‍යවසාය" යන්න යම් සමාගමක් අදාළව යෙදෙන විට, එයින්, ඒ සමාගම විසින් කරගෙන යන්නා වූ ද ඒ සමාගම යෙදී සිටින්නා වූ ද

(අ) කෘෂිකර්මාන්තය, කෘෂි පිරිසැකසුම් කිරීම, කාර්මික හා යාන්ත්‍රික මෙවලම් නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණය සහ සමාන්තර සේවා, විද්‍යුතය හෝ සාම්ප්‍රදායික නොවන නිෂ්පාදිත අපනයනය කිරීම සිදු කෙරෙන ව්‍යාපෘතියක්,

(ආ) වෙනත් යම් නාමෝපගත ව්‍යාපෘතියක් හෝ ආයෝජනය කල මුදල රුපියල් මිලියන පන්සියය ඉක්මවන්නා වූ ද නියමිත නියමු උපදෙස්වලට අනුකූල වන්නා වූ ද ව්‍යාපෘතියක් ;

අදහස් වේ.

මේ උපවගන්තියේ කාර්ය සඳහා–

(i) "කෘෂිකර්මාන්තය" යන්නෙන්, කවර හෝ විස්තරයකට අයත් ශාඛ වර්ග වගා කිරීම සහ මසුන් ඇතිකිරීම ඇතුළත් වේ ;

(ii) "සාම්ප්‍රදායික නොවන නිෂ්පාදිත අපනයනය කිරීම" යන්නෙන් මේ පනතේ 52 වන වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් භාණ්ඩ නොවන වෙනත් යම් භාණ්ඩ අපනයනය කිරීම අදහස් වේ.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ඇතැම් ව්‍යවසාය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

21ආ (1) යම් සමාගමක් විසින් (2) වන උපවගන්තියේ සඳහන් යම් නිශ්චිත ව්‍යවසායකින්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම් හැර) ලාභ සහ ආදායම, ඒ සමාගම ඒ ව්‍යවසායෙහි කර තිබෙන ආයෝජනය රුපියල්

මිලියන එක්දහස් දෙසිය පණහකට නොඅඩු නම් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි, අවුරුදු පහකට නොඅඩු එහෙත් අවුරුදු දහයකට නොවැඩි කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලබන අතර, ඒ කාලය, ඒ ව්‍යවසායේ වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ වන තක්සේරු වර්ෂයේ ආරම්භයේ සිට ගණන් බලනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා නිශ්චිත ව්‍යවසාය යන්න යම් සමාගමක් අදාළව යෙදෙන විට එයින් ඒ සමාගම විසින් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව කරගෙන යන්නා වූ ද, ඒ සමාගම යෙදී සිටින්නා වූ ද, අමාත්‍යවරයා විසින් ජාතික ආර්ථිකයෙහි යහපත සැලකිල්ලට ගෙන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි, යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ යම් ක්‍රියාකාරකමක යෙදී සිටින්නා වූ ද ව්‍යවසායක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :-

2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරන යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් නොවිය යුතු බව.

"22අ. මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද 2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ කරන ප්‍රකාශයක් යම් තැනැත්තකුට ලැබෙන 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලැබෙන ලාභ සහ ආදායම් 2003 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් නොවිය යුතු ය.";

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "හෝ (iii) වන අනුඡේදයන්හි" යන වචන වෙනුවට "හෝ (iii) වන හෝ (vi) වන අනුඡේදයන්හි" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (v) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(vi) ඒ තැනැත්තා විසින් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක දී අත් කර ගන්නා ලද යම් පරිගණක දෘඪකාංග කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ඔහු විසින් පාවිච්චි කිරීමේ දී ගෙවීයාමෙන් උද්ගත වන ක්ෂයවීම සඳහා ඒ පරිගණක දෘඪකාංග අත්කර ගැනීමේ පිරිවැය මත වර්ෂයකට සියයට සියයකට සමාන මුදල් ප්‍රමාණයක් ;";

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඒ තැනැත්තා විසින්" යන වචනවල සිට "දහයෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක්" යන වචනය දක්වා කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ඇ) ඒ තැනැත්තා විසින් කරගෙන යන වෙළෙඳාමක දී හෝ ව්‍යාපාරයක දී ඔහු ප්‍රයෝජනයට ගන්නා යම් නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා ඔහුගේ නමින් බලපත්‍රය ලබාගැනීම පිණිස ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, ඔහු විසින්-

(i) 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී කරන ලද ගෙවීම්වලින් දහයෙන් එකකට සමාන ප්‍රමාණයක් ;

(ii) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී කරන ලද ගෙවීම් වලින් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් ;";

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඇඇ) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමක දී හෝ ව්‍යාපාරයක දී ඔහු

විසින් පාවිච්චි කරනු ලබන පේටන්ට් බලපත්‍රයක්, ප්‍රකාශන අයිතියක් හෝ වෙළෙඳ ලකුණක් වැනි යම් අස්පරශනීය වත්කමක් (හැර) අත්කර ගැනීම පිණිස, 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඔහු විසින් කරන ලද ගෙවීම්වලින් හතරෙන් එකකට සමාන මුදල් ප්‍රමාණයක් :

එසේ වුවද, පෙරාතුව ම වූ තක්සේරු වර්ෂවල දී අඩු කරන ලද මුදල් ප්‍රමාණවල එකතුව, එකී ගෙවන ලද මුදලට සමාන වන්නේ නම්, එවැනි යම් ගෙවීමක් වෙනුවෙන් මේ ඡේදය යටතේ කිසි තැනැත්තකුට කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතු ය:";

(5) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "සියයට පණහකට" යන වචනවල සිට "විය යුතු ය" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(i) 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, සියයට පණහකට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය;

(ii) 2002 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසු ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට සියයට සියයකට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.";

(6) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ අතුරු විධානය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :–

"එසේ වුව ද, වාණිජ කාර්ය සඳහා පරිශ්‍ර කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ ඡේදය යටතේ අඩු කළ හැකි මුදල, ඒ පරිශ්‍රය සඳහා ලැබිය යුතු දළ කුලියෙන්–

(i) 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට දහයක් නොඉක්මවිය යුතු ය :

(ii) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ඒ පරිශ්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය.

(7) ඒ උපවගන්තියේ (ඹ) ඡේදයේ "ඒ තැනැත්තා විසින් දරන ලද වියදම" යන වචන වෙනුවට "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(8) ඒ උපවගන්තියේ (ඹ) ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ඹඹ) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් ඉහළ ශ්‍රේණියට නැංවීම සඳහා යම් විද්‍යාත්මක, තාර්මික, කෘෂිකාර්මික හෝ වෙනත් යම් පර්යේෂණ කරගෙන යාමෙහි ලා 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඒ තැනැත්තා විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් ඇතුළුව වියදම් :":

(9) ඒ උපවගන්තියේ (ත) ඡේදයේ "ඒ පුහුණුව සඳහා ඒ තැනැත්තා විසින් දරන ලද වියදම" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"ඒ පුහුණුව සඳහා ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්:

එසේ වුව ද, යම් තැනැත්තකු විසින් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක දී පුහුණු කිරීම සඳහා දරන ලද යම් වියදමක්, එම පුහුණු කිරීමේ කාලසීමාවේ දීර්ඝ බව නොසලකා අඩු කරනු ලැබිය හැකිය ය." .

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ –

(අ) (ඇ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන

ලද වියදම්" යන වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :-

"ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම් :

එසේ වුව ද, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම්, ඔහු විසින් පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට කෙලින්ම අදාළ වන්නේ නම්, ඒ තැනැත්තා විසින් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී දරන එවැනි යම් වියදම් වෙනුවෙන් අඩුකිරීමක් කරනු ලැබිය හැකි ය.";

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ජේදයේ (ii) අනුජේදයේ "ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදමක්" යන වචන වෙනුවට පහත සඳහන් කොටස අදේශ කිරීමෙන් :-

"ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදමක් :

එසේ වුව ද, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම්, එවැනි යම් ව්‍යාපාරයකට කෙලින්ම අදාළ වන්නේ නම්, ඒ තැනැත්තා විසින් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී දරන එවැනි යම් වියදම් වෙනුවෙන්, අඩු කිරීමක් කරනු ලැබිය හැකිය.";

(ඇ) ඒ උපවගන්තියේ (ඉ) ජේදයේ "සංග්‍රහ වියදම්" යන වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :-

"සංග්‍රහ වියදම් :

එසේ වුව ද, එසේ දරන ලද වියදම්, ඒ තැනැත්තා විසින් පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට කෙලින්ම අදාළ වන්නේ නම්, ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන්, 2002 අප්‍රේල් 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී දරන එවැනි යම් වියදම් වෙනුවෙන් අඩු කිරීමක් කරනු ලැබිය හැකි ය.'' ;

(ඉ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ ''ඔහුගේ විධායක නිලධරයාට'' යන වචන වෙනුවට, ''ඔහුගේ විධායක නිලධරයාට, 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :–

''(4) යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ඒ තැනැත්තා ලබන ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කිරීමේ දී යම් වියදමක මුදල ඒ වියදම දරනු ලැබූ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත ගෙවනු ලැබුවහොත් මිස, ඒ කිසි වියදමක් වෙනුවෙන් 23 වන වගන්තිය හෝ 24 වන වගන්තිය යටතේ අඩුකිරීමක් කරනු නොලැබිය යුතු ය.''.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධන කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :–

''(1අ) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව තිබුණ ද (සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ

තක්සේරු කළ හැකි ආදායම 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා –

(අ) 122අ වගන්තිය යටතේ ආදායම් බදු අඩුකරනු ලැබ තිබෙන, පොලීවලින් ලත් ව්‍යවස්ථාපිත ආදායම, සහ

(ආ) 61 වගන්තියේ (1අ) උපවගන්තිය යටතේ ආදායම් බදු අඩුකරනු ලැබ තිබෙන, ලාභාංශ බෙදා දෙන සමාගමෙන් කෙළින්ම හෝ වෙනත් යම් සමාගමක් මගින් ලැබුන ලාභාංශවලින් ලත් ව්‍යවස්ථාපිත ආදායම :

හැර, මේ වගන්තියේ සඳහන් අඩුකිරීම්වලට යටත්ව ඔහුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම විය යුතු ය :

එසේ වුව ද, 122අ වන වගන්තියේ හෝ 61 වන වගන්තියේ (1අ) යටතේ පිළිවෙලින් ආදායම් බදු අඩුකරනු ලැබ පොලිවලින් හෝ ලාභාංශවලින් යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද ආදයම යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී ඒ වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් ලත් ආදායමක් ලෙස ලබා ඇත්නම්, පොලියෙන් හෝ ලාභාංශවලින් ලත් ඒ ආදායම ඒ තැනැත්තාගේ මුලු ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් විය යුතු ය:";

(2) ඒ වගන්තියේ, (2) වන උපවගන්තියේ –

(අ) (අ) ඡේදයේ "ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල්" යන වචන වෙනුවට, "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(අඅ) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු යම් තක්සේරු වර්ෂයක්

සඳහා වාර්ෂිකයක්, බිම් කුලියක්, රාජ්‍ය භාගයක් හෝ 23 වන වගන්තිය යටතේ අඩුකළ නොහැකි පොලියක් වශයෙන් ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණ :

එසේ වුව ද,

(i) ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින වෙනත් යම් තැනැත්තකුට, පොලී, වාර්ෂිකයක්, බිම් කුලී හෝ රාජ්‍ය භාග වශයෙන් ගෙවන ලද යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ නොදිය යුතු ය ;

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක්, ඒ වර්ෂයේ සඳහා වූ මුළු ව්‍යවස්ථාපිත ආදායම ඉක්මවා යන අවස්ථාවක, මේ වගන්තියේ කාර්යය සඳහා, ඒ වර්ෂය තුළ දී වෙළෙඳාමකින් සිදු වූ අලාභයක් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරයට ම ඒ අතිරික්තය සම්බන්ධයෙන් ද ක්‍රියා කළ යුතු ය ;

(iii) ඒ තැනැත්තා විසින් යම් මුදල් ප්‍රමාණයක් වාර්ෂිකයක් වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක, ඒ වාර්ෂිකය–

(අ) දික්කසාද දීමනාවක් වශයෙන් හෝ නඩත්තු මුදල් වශයෙන් අධිකරණයේ නියෝගයක් යටතේ ගෙවනු ලබන්නේ නම් ;

(ආ) යථාපරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ ඔහුගේ කලත්‍රයාට ගෙවනු ලබන්නේ නම් ;

(ඇ) මුදලින් සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව හෝ මුදල් වටිනාකමින් ගෙවනු ලබන්නේ නම්,

මිස ඒ මුදල් වෙනුවෙන් අඩු කිරීමක් නොකළ යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා 'පොලිය' යන යෙදුමෙන්, බැංකුවකින්, මුල්‍ය ආයතනයකින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයකින් ලබාගත් ණයයක් මත, යම් තක්සේරු වර්ෂයක දී ගෙවන ලද යම් පොලියක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ). (i) 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම රුපියල් එක්ලක්ෂ හතලිස් හතර දහසක දීමනාවක් ; හෝ

(ii) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම රුපියල් දෙලක්ෂ හතලිස් දහසක දීමනාවක් ;".

(2) ඒ උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"එසේම තවදුරටත් 2002 අංක 7 දරන දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු ඔහුගේ බදු අය කළ හැකි ආදායම නිශ්චය

කිරීමේ දී, ඒ ප්‍රකාශයේ සඳහන් ආයෝජනයට අදාළව කරන ලද යම් ආයෝජනයක් මත හෝ දරන ලද යම් ආයෝජනයක් මත හෝ දරන ලද යම් වියදමක් මත (ආ) ඡේදයෙහි සඳහන් දීමනාවක් අඩු කිරීමට ඔහුට හිමිකම නොලැබිය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ —

(අ) (ඖ) ඡේදයේ "සඳහා වන්නා වූ ද ඉදිරිපත් කිරීමක් අදහස් වේ." යන වචන වෙනුවට "සඳහා වන්නා වූ ද ඉදිරිපත් කිරීමක් අදහස් වේ.": යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) (ඖ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"(ඵ) (ඒ) ඡේදයේ සඳහන් ණය මුදලකින් නොවන යම් පුද්ගලයකු විසින් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, නිවසක් ඉදිකිරීම හෝ මිල දී ගැනීම සඳහා දරන ලද යම් වියදමක්, මේ අවස්ථා දෙකෙන් කවර අවස්ථාවක දී වුව ද එය ඒ පුද්ගලයා 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකළ හෝ මිල දී ගත් පළමු නිවස විය යුතු ය.

(ඒ) යම් පුද්ගලයකු විසින්, 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නිවසක් ඉදිකිරීම සඳහා හෝ මිල දී ගැනීම සඳහා වූ යම් අනුමතිය ලත් නිවාස ණය මුදලක මුල් මුදල ආපසු ගෙවීම සඳහා දරන ලද යම් වියදමක්, මේ අවස්ථා දෙකින් කවර අවස්ථාවක දී වුව ද එය ඒ පුද්ගලයා 2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඉදිකළ හෝ මිල දී ගත් පළමු නිවස විය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා "අනුමතිය ලත් නිවාස ණය" යන්නෙන්, ආණ්ඩුවෙන් හෝ මුදල් නීති පනතේ අර්ථානුකූලව යම් බැංකු ආයතනයකින් හෝ යම් පළාත් සභා අරමුදලක්, පළාත් පාලන ආයතනයකින් හෝ නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වෙනත් යම් ආයතනයකින් හෝ ලබාගත් ණය මුදලක් අදහස් වේ.".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ –

(අ) (v) වන අනුඡේදයේ "රුපියල් විසිපන් දහසක් නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට, "රුපියල් විසිපන් දහසක් නොඉක්මවිය යුතු ය," යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (v) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

"(vi) ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තා විසින් කරන ලද (2) වන උපවගන්තියේ (එ) සහ (ඒ) ඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් තක්සේරු කළහැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් එක් ලක්ෂයක් යන මේ දෙකින් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(6අ) (2) වන උපවගන්තියේ, (එ) ඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමකට දෙනු ලබන දීමනාවකින්, ඒ වියදම දරන ලද තක්සේරු වර්ෂයේ තක්සේරු කළහැකි ආදායමෙන් අඩු කළ නොහැකි අතිරික්තය, ඒ වියදම දරන ලද තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම අනුප්‍රාප්ත වන අවුරුදු නවයකට නොවැඩි කාලසීමාවක් තුළ විභාජනය කරනු ලැබිය හැකි අතර, එසේ විභාජනය කරනු ලැබූ මුදල් ප්‍රමාණය, ඒ එක් එක් තක්සේරු වර්ෂයේ දී දරන ලද සුදුසුකම් ලැබීමේ ගෙවීමක් ලෙස සැලකිය යුතු ය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පළමුවන උපලේඛනයේ I වන කොටසෙහි සඳහන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "පළමුවන උපලේඛනයේ I වන හා Iඅ කොටස්වල සඳහන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) "පළමුවන උපලේඛනයේ (III) වන කොටසෙහි සඳහන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "පළමුවන උපලේඛනයේ (III) වන හා (IIIඅ) වන කොටස්වල සඳහන්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්", සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "ඒ මුදල" යන වචනවල සිට අතුරු විධානය අග දක්වා වූ සියලු වචන වෙනුවට "(3) වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට "ප්‍රාග්ධන ලාභ" යන සඳහන "ඒ මුදලට" වන සඳහනක් වූවාක් සේ, ඒ මුදලින් ආදායම් බදු අය කළ යුතු ය යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "යම් ප්‍රාග්ධන ලාභයක් ඒ තැනැත්තාගේ" යන වචන වෙනුවට, "යම් ප්‍රාග්ධන ලාභයක් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක ඒ තැනැත්තාගේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "යම් ප්‍රාග්ධන ලාභයක් ඇතුළත් වන අවස්ථාවක දී" යන වචන වෙනුවට "යම් ප්‍රාග්ධන ලාභයක්, 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ඇතුළත් වන අවස්ථාවක දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "ප්‍රාග්ධන ලාභ කිසිවක් ඇතුළත් වන" යන වචන වෙනුවට "ප්‍රාග්ධන ලාභ කිසිවක් 2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක ඇතුළත් වන අවස්ථාවක" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ සහ 40ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ සහ 40ආ වගන්ති ලෙස පිළිවෙළින් බලපැවැත්විය යුතු ය :–

"විශේෂඥතාවට පත් නිවාස බැංකුවලට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.

40අ. (1) විශේෂඥතාවට පත් නිවාස බැංකුවක් ලෙස ව්‍යාපාරය කරගෙන යන යම් සමාගමක, 2002 අප්‍රේල් මස 1 වන දින දී හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමට, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ ව්‍යාපාරයෙන් ලැබූ යම් ලාභ සහ ආදායම ඇතුළත් වන අවස්ථාවක, එම බදු අය කළ හැකි ආදායමෙහි ඒ ලාභ හා ආදායමෙන් සංයුක්ත වන කොටස සඳහා, මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, සියයට විස්සක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "විශේෂඥතාවට පත් නිවාස බැංකුව" යන්නෙන්, පදිංචිය සඳහා නිවාස සැපයීම හා සම්බන්ධ කටයුතු සඳහා පමණක් මුදල් ණය දීමෙහි නිරත, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලත් වාණිජ බැංකුවක් හෝ විශේෂඥතාවට පත් බැංකුවක් අදහස් වේ.

බදුවලින් නිදහස් කාලය ඉකුත් වූ පසු ඇතැම් සමාගම්වලට අදාළ වන්නා වූ ආදායම් බදු අනුප්‍රමාණය.

40ආ. (1) 21ආ වගන්තියේ සඳහන් යම් සමාගමක ලාභ හා ආදායම ආදායම් බද්දෙන් නිදහස්ව පැවති කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, ආරම්භ වන කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ඒ සමාගමේ ලාභ සහ ආදායමෙන්, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.

(2) මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, 21අ වගන්තියේ සඳහන් යම් සමාගමක, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ හා ආදායම

(අ) ඒ සමාගමේ ලාභ හා ආදායම, ආදායම් බද්දෙන් නිදහස්ව පැවති කාලසීමාවට ඉක්බිතිව ම අනුප්‍රාප්ත වන තක්සේරු වර්ෂ දෙකෙන් එක් එක් වර්ෂය සඳහා වර්ෂයකට සියයට දහයක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකළ යුතු ය ;

(ආ) (අ) ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ආරම්භවන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම –

(i) ඒ සමාගම, කෘෂිකර්මයෙහි හෝ සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය කිරීමෙහි නිරත සමාගමක් නම්, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකළ යුතු ය.

(ii) ඒ සමාගම, කෘෂිකර්මයෙහි හෝ සාම්ප්‍රදායික නොවන නිෂ්පාදන අපනයනය කිරීමෙහි නිරත සමාගමක් නොවන සමාගමක් නම්, සියයට විස්සක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අයකළ යුතු ය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

ඇතැම් ලාභාංශ සම්බන්ධයෙන් ආදායම් බදු අනුප්‍රමාණය.

48අ. යම් තක්සේරු වර්ෂයක් සඳහා (සමාගමක් නොවන, යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට කොටස් හෝ සෘණපත්‍ර ආකාරයෙන් 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව

ප්‍රකාශයට පත් කළ ලාභාංශයක් ඇතුළත් වන අවස්ථාවක, ඒ ලාභාංශය නියෝජනය වන බදු අය කළ හැකි ආදායම මත සියයට දහයක අනුප්‍රමාණය අනුව බදු අය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. 2001 අංක 8 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ, (1) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "මුදල් ප්‍රමාණයකින් ; සහ" යන වචන වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් :–

"මුදල් ප්‍රමාණයකින් :

එසේ වුව ද, 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද රුපියල් එක් මිලියනයක් ඉක්මවා යන අවස්ථාවක, ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදයම් බදු මුදල රුපියල් එක් මිලියනය ඉක්මවන ප්‍රමාණය, ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම රුපියල් මිලියන පහක් ඉක්මවා යන මුදල් ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය.";

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ තක්සේරු වර්ෂය සඳහා" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන ඒ තක්සේරු වර්ෂය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(ආආ) 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලැබුවේ යම් ලාභ මත ද ඒ ලාභවලින් ඒ තක්සේරු වර්ෂයේ දී බෙදා හරිනු ලැබූ දළ ලාභාංශවල සමස්ත මුදලින් සියයට දහයකට සමාන මුදලකින් සමන්විත විය යුතු ය ;";

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඒ තක්සේරු වර්ෂයේ දී" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන ඒ තක්සේරු වර්ෂයේ දී" යන වචන ආදේශ කිරීමෙන්.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සෑම තක්සේරු වර්ෂයක් තුළ වූ" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් තුළ වූ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "දෙවන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ මුදලට සමාන මුදලකින් ; සහ" යන වචන වෙනුවට "මේ පනතේ දෙවන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ මුදලට සමාන මුදලකින්" :

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුවද, 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද රුපියල් එක් මිලියනයක් ඉක්මවා යන අවස්ථාවක ඒ සමාගම විසින් ගෙවනු ලැබිය යුතු ආදායම් බද්ද රුපියල් එක් මිලියනයක් ඉක්මවා යන්නේ යම් මුදල් ප්‍රමාණයකින් ද ඒ මුදල, ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම රුපියල් මිලියන පහක් ඉක්මවා යන මුදල් ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ "යම් තැනැත්තකුට ගෙවනු ලැබිය යුතු" යන වචනවල සිට "සියයට පහළොවකට සමාන" යන වචන දක්වා වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

"යම් තැනැත්තකුට 2002 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ ගෙවනු ලැබිය යුතු වන යම් ලාභාංශයක් (මින් මතු මෙම වගන්තියෙහි "අදාළ ලාභාංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලාභාංශයක සම්පූර්ණ මුදල හෝ කොටසක් යම් තිල ලැයිස්තුගත පොදු

සමාගමක් විසින් 2002 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙරාතුව බෙදා හරිනු ලැබ කෙලින් ම හෝ අතරමැදි සමාගම් එකක් හෝ වැඩි ගණනක් මගින් හෝ යට කී නේවාසික සමාගමට ලැබුනා වූද එහෙත් මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් වූ ලාභාංශයක සම්පූර්ණ මුදල හෝ කොටසක් නොවන්නා වූද සම්පූර්ණ ලාභාංශයෙන් හෝ එහි කොටසකින් යම් ලාභාංශයක් සමන්විත වන්නේ නම්, අදාළ ලාභාංශයෙන් සියයට දහයකට සමාන";

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය, පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් කොටස්කරුවකුට ලාභාංශ ගෙවිය යුතු" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් කොටස්කරුවකුට ලාභාංශ ගෙවිය යුතු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

'(1අ) සෑම වාසික සමාගමකට ම, 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කිරීමට පදනම් කරගන්නා ලාභවලින්, මුදලින් හෝ මුදල් ගෙවීමට කෙරෙන අණකර ආකාරයෙන් යම් කොටස්කරුවකුට ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන ආදායම් බද්දක් අඩුකර ගැනීමට හිමිකම තිබිය යුතු ය." ;

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "(1) වන උපවගන්තිය යටතේ" යන වචන වෙනුවට "(1) වන හෝ (1අ) වන උපවගන්ති යටතේ" යන වචන ආදේශ කිරීමෙන්".

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක දී" යන වචන වෙනුවට, "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 122අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 122අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් ගෙවන පොලියෙන් ආදායම් බදු අඩුකළ යුතු බව.

122අ. (1) සෑම බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් ම මේ පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව, 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක දී යම් මුදල් ප්‍රමාණයක් මත ගෙවිය යුතු පොලියෙන්–

(අ) යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඔහුගේ හෝ එහි නාමයෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගේ නමින් හෝ යම් තැනැත්තකුගේ නැතහොත් හවුල් ව්‍යාපාරයක නමක් නොමැතිව ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ තැන්පත් කර ඇති යම් මුදල් ප්‍රමාණයක් මත ; සහ

(ආ) ඒ මුදල් ප්‍රමාණය සඳහා ගෙවිය යුතු පොලිය මසකට රුපියල් හය දහසකට හෝ වර්ෂයකට රුපියල් හැත්තෑ දෙදහසකට අඩු නො වන්නේ නම් ;

එම පොලිය ගෙවන අවස්ථාවේ දී, එම තැන්පතුව මත උපයා තිබෙන සම්පූර්ණ පොලී මුදලින් සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩුකරගත යුතු ය :

එසේ වුව ද, පුණ්‍ය ආයතනයක් ලෙසට කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කරන ලද ආයතනයක් වනවිට, යම් තැන්පතුවක් මත ඒ ආයතනයට උපචිත වන, මසකට රුපියල් දොළොස්

දහසක් හෝ වර්ෂයකට රුපියල් එක්ලක්ෂ හතලිස් හතර දහසක් නොඉක්මවන යම් පොලියක් සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය:

එසේම තවදුරටත්, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණයක් මත, යම් තක්සේරු වර්ෂයක දී ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු යම් පොලී මුදලකින්, වර්ෂයකට සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩු කරන ලෙස යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, ඒ මුදල් ප්‍රමාණය වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු පොලිය රුපියල් හැත්තෑ දෙදහසකට වඩා අඩු වුව ද, ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය ඒ ඉල්ලීම අනුව කටයුතු කළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ අඩුකර ගැනීමක කාර්ය සඳහා–

(අ) "පොලිය" යන්න, මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන විට, එයට, එම මුදල් ප්‍රමාණය තැන්පත් කර ඇත්තේ යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක නමින් ද නැතහොත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ද, ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතු හෝ එහි ප්‍රතිලාභය පිණිස උපචිත වන පොලී, වට්ටම් හෝ වෙනත් යම් මුදලක් ඇතුළත් වන නමුත් 10 වන වගන්තිය යටතේ නිදහස් කරන ලද යම් පොලියක් යම් අමාත්‍යාංශයකට, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, යම් පළාත් පාලන ආයතනයකට, පළාත් සභාවක් යටතේ වූ යම් ආයතනයකට හෝ කිසියම් විදේශීය ආණ්ඩුවකට ගෙවිය යුතු යම් පොලියක් ඊට ඇතුළත් නොවේ.

(ආ) වට්ටමක් සම්බන්ධයෙන් වන විට, ඒ වට්ටමට ඉඩ හරින අවස්ථාවේ දී එම පොලිය ගෙවන ලද සේ සැලකිය යුතු ය.

(3) බදු අඩුකර ගැනීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමේ උපක්‍රමයක් යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් යොදාගෙන තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක ඒ බැංකුව හෝ මූල්‍ය ආයතනය විසින් එසේ මග හරින ලද බද්ද මෙන් සියයට පන්සියයක දණ්ඩන මුදලක් ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් එම බැංකුවට හෝ මූල්‍ය ආයතනයට නියම කළ හැකි ය.

සැක දුරු කිරීම සඳහා (1) වන උපවගන්තියේ "පොලිය ගෙවන අවස්ථාවේ දී ඒ තැන්පතුව මත උපයා තිබෙන සම්පූර්ණ පොලී මුදලින් අඩු කර ගත යුතු ය." යන්නට වෙනත් ගිණුමකට පොලිය බැර කිරීම ඇතුළත් වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු" යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. 2001 අංක 8 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියේ, (2) වන උපවගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "නිශ්චිත ගාස්තුව" යන්නෙහි අර්ථකථනයේ (ආ) ඡේදයේ "2001 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2001 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(2) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(ඈ) 2002 අප්‍රේල් මස වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි යම් තැනැත්තකු විසින් හෝ යම් හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ යම් වෘත්තියක් හෝ රක්ෂාවක් හෝ වෙනත් යම් ස්වාධීන ස්වභාවයකින් යුත් කටයුත්තක් කරගෙන යාමේ දී අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉටුකරන ලද සේවාවන් සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන් යම් නිශ්චිත තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු, මුළු එකතුව–

(i) මසකට රුපියල් පණස් දහසකට අඩු නොවන : සහ

(ii) වෙනත් යම් කාරණයක දී වර්ෂයකට රුපියල් පන් ලක්ෂයකට අඩු නොවන,

යම් මුදලක් හෝ මුදල් අදහස් වන අතර ඒ නිශ්චිත තැනැත්තා විසින් ගෙවිය යුතු යම් කොමිස් මුදලක්, තැරැව් ගාස්තුවක් හෝ ඒ සමාන ස්වභාවයක වූ වෙනත් මුදලක් ඊට ඇතුළත් වන නමුත්, ඒ නිශ්චිත තැනැත්තා යටතේ වූ සේවා නියුක්තියක් අතරතුර ඒ නිශ්චිත තැනැත්තාගේ යම් සේවා නියුක්තයකුට ගෙවිය යුතු යම් මුදලක් හෝ 131අා වගන්තියේ (2) වන උපවගන්තියේ අර්ථ නිරූපණය කර ඇති "නිශ්චිත ඉඩම හෝ ගොඩනැගිල්ල" පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන් ගෙවන යම් කුලියක්, බදු කුලියක් හෝ වෙනත් ගෙවීමක් ඊට ඇතුළත් නොවේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ XVIඅ යන අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ XVI වන පරිච්ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ XVIඅ වන පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු ය :—

"XVIඅ පරිච්ඡේදය

පදිංචිය සඳහා හැර, යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවනු ලබන කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම.

කුලී, බදු කුලී යනාදිය ගෙවන තැනැත්තන් විසින් ආදායම් බදු අඩුකරගත යුතු බව.

131අ. 2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් නිශ්චිත ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්, නිවාසයක් වශයෙන් නොවන අන්‍යාකාරයකින් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම වෙනුවෙන් යම් කුලියක්, බදු කුලියක් හෝ වෙනත් ගෙවීමක් කරන සෑම තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ඒ කුලිය, බදු කුලිය හෝ වෙනත් ගෙවීමක් කරන අවස්ථාවේ දී ඒ කුලියෙන්, බදු කුලියෙන් හෝ වෙනත් ගෙවීමෙන් සියයට දහයක අනුප්‍රමාණය මත ආදායම් බදු අඩුකරගත යුතු ය.

XV වන පරිච්ඡේදයේ විධිවිධාන මේ පරිච්ඡේදයට අදාළ විය යුතු බව.

131ආ. (1) බැංකු සහ මූල්‍ය ආයතන විසින් ගෙවන ලද පොලියෙන් ආදායම් බදු අඩු කිරීමට, එසේ අඩුකර ගන්නා ලද ආදායම් බදු වෙනුවෙන් බැර, බැංකුවල සහ මූල්‍ය ආයතනවල කාර්ය, ආදායම් බදු අඩුකර ගැනීමේ දී පැහැර හැරීම්, බැංකු සහ මූල්‍ය ආයතන මත තක්සේරු කිරීම, අභියාචන සහ පැහැර හැරීම් සම්බන්ධ දණ්ඩන යන විෂයයන්ට අදාලව XV වන පරිච්ඡේදයේ ඇති විධිවිධාන, 131අ වගන්තියේ සඳහන් කර ඇති පරිදි වූ එකී කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීම්වලින් ආදායම් බදු අඩුකර ගැනීම සම්බන්ධයෙන් ද එසේ අඩුකර ගන්නා ආදායම් බදු සඳහා බැර, එම කුලී ගෙවීමට, බදු කුලී ගෙවීමට හෝ වෙනත් ගෙවීම් කිරීමට යටත් තැනැත්තන්ගේ කාර්ය, ආදායම් බදු අඩුකර ගැනීමෙහි ලා පැහැර හැරීම්, ඒ තැනැත්තන්ට තක්සේරු නිකුත් කිරීම, අභියාචන, සහ මේ පරිච්ඡේදය යටතේ පැහැර හැරීම් සම්බන්ධ දණ්ඩන, යන විෂයයන් XV වන පරිච්ඡේදයේ "බැංකු සහ මූල්‍ය ආයතන" යන වචන වෙනුවට, "ඒ බදු ගෙවීම්, බදු කුලී ගෙවීම් හෝ වෙනත් ගෙවීම්

කිරීමට යටත් තැනැත්තන්" යන වචන ද "පොලිය" යන වචනය වෙනුවට "කුලී හෝ බදු කුලී හෝ වෙනත් ගෙවීම්" යන වචන ද ඒ පරිච්ඡේදයේ යෙදෙන කවර හෝ විටෙක එලෙස ආදේශ කරනු ලැබූ ලෙස, අදාළ විය යුතු ය. එසේ වුව ද, යම් තැනැත්තකු විසින් ඒ දේපළෙහි යම් හවුල් අයිතිකරුවන්ට ගෙවන ලද යම් බදු, බදු කුලී හෝ වෙනත් යම් ගෙවීම්වලින් මේ පරිච්ඡේදය යටතේ අඩුකර ගන්නා ලද ආදායම් බදු සඳහා බැර වාසිය, ඒ හවුල් අයිතිකරුවන් අතර, ඒ දේපළට ඔවුන්ට ඇති හවුල් අයිතිකාරත්වයේ අනුපාතය මත, බෙදා හැරිය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා–

"නිශ්චිත ඉඩම හෝ ගොඩනැගිල්ල" යනුවෙන්, යම් ලිත් මාසයක් සඳහා හෝ ඉන් කොටසක් සඳහා ගෙවිය යුතු කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීමේ මුදල් ප්‍රමාණය රුපියල් පණස් දහසකට අඩු නොවන හෝ යම් වර්ෂයක් සඳහා ගෙවිය යුතු මුළු කුලී, බදු කුලී හෝ වෙනත් ගෙවීමේ මුදල් ප්‍රමාණය, රුපියල් පන්ලක්ෂයකට අඩු නොවන ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තියේ "විධායක නිලධරයා" යන අර්ථ නිරූපණයෙහි "රුපියල් පන්දහසකට අඩු නොවන" යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට අඩු නොවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

34. 2001 අංක 8 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධන කරනු ලැබේ :–

(1) එම උපලේඛනයේ I වන කොටසේ "II වන කොටසෙහි සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා II වන කොටසෙහි සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයෙහි 1 වන කොටසට ඉක්බිතිව ම පහත සඳහන් කොටස ඇතුළත් කිරීමෙන් :-

"I අ කොටස

2002 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා II වන කොටසේ සඳහන් පුද්ගලයන් හැර වෙනත් පුද්ගලයන්

බදු අයකළ හැකි ආදායමෙන් පළමුවන 180,000 සම්බන්ධයෙන්	සියයට 10
බදු අයකළ හැකි ආදායමෙන් ඊළඟ 180,000 සම්බන්ධයෙන්	සියයට 20
ඉතිරි කොටස මත	සියයට 35" ;

(3) ඒ උපලේඛනයේ III වන කොටසේ "32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ උපලේඛනයේ අගට මෙහි පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"IIIඅ කොටස

32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දැක්වෙන, සේවා නියුක්තියෙන් 2002 අප්‍රේල් [illegible] 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් ත[illegible]ස්රු වර්ෂයක දී ලබන ඇතැම් ලාභවලට අදාළ ආදා[illegible]දු අනුප්‍රමාණය පහත දැක්වෙන පරිදි වේ—

පළමු රු. 1,000,000	කිසිවක් නැත
ඊළඟ රු. 5,00,000	සියයට 5
ඊළඟ රු. 500,000	සියයට 10
ඉතිරි කොටස මත	සියයට 15."

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) "ඒකක භාරයක්, අන්‍යෝන්‍ය අරමුදලක්, ඇතැම් සමාගමක්," යන වචන වෙනුවට "2002 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ඒකක භාරයක් සහ අන්‍යෝන්‍ය අරමුදලක් ඇතුළු සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ අගට පහත දැක්වෙන කොටස එකතුකිරීමෙන් :–

"2002 අප්‍රේල් මස 1 වන දිනට පසුව ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා, ඒකක භාරයක් සහ අන්‍යෝන්‍ය අරමුදලක් ඇතුළු සමාගමක්—

'ඒ තක්සේරු වර්ෂයේ දී, සමාගමේ, ඒකක භාරයේ හෝ අන්‍යෝන්‍ය අරමුදලේ බදු අය කළ හැකි ආදායම රු. 5,000,000 ක් නොඉක්මවන අවස්ථාවක

සියයට 20

ඒ තක්සේරු වර්ෂයේ දී, සමාගමේ ඒකක භාරයේ හෝ අන්‍යෝන්‍ය අරමුදලේ බදු අය කළ හැකි ආදායම රු 5,000,000 ක් ඉක්මවන අවස්ථාවක

සියයට 35".

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයේ "අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය:" යන වචන වෙනුවට "2000 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2002 අප්‍රේල් මස, 1 වන දිනට පෙර, ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා අත්තිකාරම් සමාගම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

වගකීමෙන් ආරක්ෂාව.

37. (1) අවස්ථාවෝචිත පරිදි 122අ, 131 හෝ 131අ වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි, 2002 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනය දක්වා වූ කාලය තුළ බද්ද අඩු කර ගන්නා සහ ඒ බද්ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කරන යම් තැනැත්තකු හෝ යම්

හවුල් ව්‍යාපාරයක් නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අඩුකිරීම සහ ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමකින් මුක්තිදානය කරනු ලැබිය යුතු ය.

(2) 122අ වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, 2002 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දිනය දක්වා වූ කාලය තුළ ස්වකීය පාලනයෙන් බැහැර හේතු නිසා බද්ද අඩු කර ගැනීමට නොහැකි වන යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක්, ඒ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ පාලනයෙන් පරිබාහිර හේතු නිසා ඒ බද්ද අඩුකර ගැනීමට නොහැකි වී තිබෙන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අවස්ථාවක, මේ පනතේ එකී විධිවිධාන උල්ලංඝනය කර ඇති ලෙස නොසැලකිය යුතු ය.

38. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.